# සමාජ මාධ්‍ය ප්‍රකාශනය

## කොළඹ | 2019

වගකීම් සහගත සමාජ මාධ්‍ය භාවිතාවක් සඳහා වන මගපෙන්වීම් මාලාව

COLOMBO I 2019

**social media declaration**

#EngageSMinSL

## පසුබිම

සමාජ මාධ්‍යය යනු පරිශීලකයන්ට එකිනෙකා සමඟ අන්තර්ක්‍රියා කිරීමට, අන්තර්ගතයන් නිෂ්පාදනය කිරීමට, ඉදිරිපත් කිරීමට හා ප්‍රවර්ධනය කිරීමට ඉඩ සලසා දෙන, අන්තර්ජාලය පදනම් කර ගත් විවිධ යෙදවුම්, වෙබ් අඩවි හා වේදිකාවන් ය. එමෙන් ම ප්‍රාදේශීය, ජාතික, කලාපීය හා ගෝලීය පරිශීලකයන් සමඟ සම්බන්ධ වීමට ද එමඟින් හැකියාව ලැබේ. භූගෝලීය සීමා මායිම් අතික්‍රමණය කරන බැවින් සමාජ මාධ්‍යය පරිශීලකයන්ට නිරන්තරයෙන් තමන්ගේ රටෙහි හෝ එහි දේශපාලන සන්දර්භය මඟින් සම්පාදන කරන ප්‍රකාශනයෙහි නිදහස ඉක්ම වූ නිදහසක් භුක්තිවිඳීමට හෝ අත්පත් කරගැනීමට ඉඩකඩ සැලසේ. සමාජ මාධ්‍යයට ආවේණික ගුණාංග හා සැකැස්ම විසින් ලබාදෙන එකී විවෘතභාවය ධනාත්මක සහ ඍණාත්මක වේ. ඇතැම් පරිශීලකයෝ තමන් ප්‍රකාශ කරන අදහස්, වගකීම් සහගත ප්‍රගතිශීලී හා ගෞරවනීය ආකාරයෙන් ඉදිරිපත් කරති. සෙසු පිරිශීලකයෝ එසේ නොකරති.

ක්‍රියාකාරීව සංවාදවලට හා සමාජ අන්තර්ක්‍රියාවලට සහභාගී වීමටත් ඒ සඳහා බහුවිධ මාධ්‍යය භාවිතා කිරීමටත් සමාජ මාධ්‍යය සෑම පරිශීලකයෙකුට ම අවස්ථාව සලසා දෙයි. දැනුම බෙදාහදා ගැනීම, විචාරශීලී සංවාද නිර්මාණය කිරීම, අධිපතිවාදී චින්තන ධාරාවන් ප්‍රශ්න කිරීම සහ විකල්ප කතිකාවන් ගොඩ නැගීම යන මේ සියලු දෙය ම සමාජ මාධ්‍යය තුළ කළ හැකි ය. තීරණාත්මක සිදුවීම් හා අවස්ථා ආශ්‍රිතව සාමූහික ක්‍රියාකාරකම් වල නිරත වීමට, සංවිධානය කිරීමට මෙන්ම ඒවාට අදාළව පෞද්ගලික මත දැරීමට හා ඉදිරිපත් කිරීමට ද සමාජ මාධ්‍යය ඉඩ සලසා දෙයි. බොහෝ විට මෙම අන්තර්ක්‍රියාවන්හි දී භූගෝලීය, දේශපාලනික හා වෙනත් භෞතික සීමා මායිම්වලින් කිසිදු බාධාවක් සිදු නොවේ. එම නිසා විවිධ ප්‍රදේශ, කාල කලාප හා රටවලට අයත් සම්භාෂකයෝ සහ අන්තර්ගත සම්පාදකයෝ මෙම පොදු අවකාශයන්හි දිගින් දිගට ම සිය අදහස් ඉදිරිපත් කිරීමෙහි හෝ අන්‍යයන්ගේ අදහස්වලට අභියෝග කිරීමෙහි නිරත වෙති.

සමාජ මාධ්‍යයෙහි ප්‍රකාශනය හෝ ප්‍රවර්ධනය කරනු ලබන අන්තර්ගතය ඇතැම් විට පොදු යහපතට හානි පමුණුවන, සමාජ-දේශපාලනික වෙනස්කම් නිර්මාණය කරන හෝ තීව්‍ර කරන බව දක්නට ලැබේ.

ශ්‍රී ලංකාවේ දී පවා ස්ත්‍රී පුරුෂ සමාජභාවය, ජාතිකත්වය, ආගම, කුලය හෝ ලිංගික දිශානතිය වැනි සාධක පදනම් කර ගෙන වෛරය හා ප්‍රචණ්ඩත්වය උසි ගන්වනසුලු අන්තර්ගතයේ තියුණු වැඩි වීමක් සිදු වෙමින් පවත්නා බව දක්නට ලැබේ. සමාජ මාධ්‍යය අයථා භාවිතයේ නිපුණ ඇතැම් පුද්ගලයෝ සහ ක්‍රියාකාරකයෝ ස්වල්ප දෙනෙක් පටු වාසි අපේක්ෂාවෙන් විසම්මුතික මත හා සංවාදයට ඉතා වැදගත් අදහස් නොසලකා හරිති. ලොව පුරා වාර්තාවලින් පෙන්නුම් කෙරෙන්නේ සමාජ මාධ්‍යයේ හානිකර බලපෑම් හා එය අවභාවිත කෙරෙන ස්වරූප අතරට අතිනවීන දේශපාලන හා අලෙවි ප්‍රචාරණ ව්‍යාපාර, දත්ත සොරකම, ව්‍යාජ තොරතුරු පතුරවා හැරීම හා අනන්‍යතා සොරකම ද ඇතුළත් වන බව යි.

ආණ්ඩු සහ සමාජ මාධ්‍යය සමාගම් ඇතුලු වෙනත් අධිකාරීන් සමාජ මාධ්‍යය අයථා භාවිතය පාලනය කිරීම සඳහා දැඩි උත්සාහයක යෙදී සිටියි. එසේ කිරීමද අවදානම් සහගත වන්නේ එමගින් ඒකාධිපති පාලනතන්ත්‍රවලට ව්‍යාජ තොරතුරු පිළිබඳ තර්ජනය හුවා දක්වමින් තමන්ගේම වූ ඩිජිටල් ප්‍රචාරණ යාන්ත්‍රණ උත්පාදනය කිරීමට හෝ නව නීති සම්පාදනය කරමින් විරුද්ධ මත නිහඬ කිරීමට අවස්ථාව සැලසෙන බැවිණි.

මෙම ප්‍රකාශනය සමාජ මාධ්‍යය තුළ හෝ සමාජ මාධ්‍යය සම්බන්ධයෙන් ගත් විට අදහස් පළ කිරීමේ නිදහසෙහි පවත්නා අනුල්ලංඝනීය වැදගත්කම හඳුනා ගැනීමට දරන ප්‍රයත්නයක් වන අතර, ආචාර ධර්මීය, ප්‍රගතිශීලී, ප්‍රජාතන්ත්‍රවාදී මෙන්ම මානව අයිතිවාසිකම් මත පදනම් වූ හා සමාජ වගකීමක් සහිත සමාජ මාධ්‍යය භාවිතය දිරි ගන්වන්නක් හා ශක්තිමත් කරන්නක් ද වේ.

# අරමුණ

වගකීම් සහගත සමාජ මාධ්‍යය භාවිතාවක් සඳහා සියලු දෙනාට ඩිජිටල් සාක්ෂරතාවය සමඟ තොරතුරු සමාජයකට ප්‍රවේශ වීමේ අයිතිය තහවුරු කරමින්, සමාජ මාධ්‍යය නිශේධනාත්මක ලෙස පරිශීලනය කිරීමේ ශක්‍යතා බැහැර කරමින්, සමාජ සාධාරණත්වය, මානව ගරුත්වය ඇතුලු **'මානව හිමිකම් මත පදනම් වූ'** උසස් මානව සමාජ ගතිකයන් ආරක්ෂා කරනු වස් සමාජ මාධ්‍යය ප්‍රජාව දිරි ගැන්වීම.

# කවුරුන් විසින් ද?

මෙම ප්‍රකාශනයට අත්සන් තබන අය, අන්‍යෝන්‍ය එකඟතාවෙන් සම්මත කර ගත් මෙම සම්මුතිය අනෙකුත් අය අතර ප්‍රවර්ධනය කිරීම සඳහා, සියලු සමාජ මාධ්‍යය වේදිකා හා ඩිජිටල් අවකාශයන් තුළ දී මෙන්ම මුද්‍රිත, විකාශන හා විද්‍යුත් මාධ්‍යය ඇතුලු ඩිජිටල් නොවන අවකාශයන් තුළ දී නිරන්තරයෙන් හා තමන්ට හැකි උපරිම අයුරින් කටයුතු කරනු ඇත.

# මක් නිසා ද?

- ඔන්ලයින් අවකාශ තුළ අදහස් පළ කිරීමේ නිදහස ඇතුලු මානව අයිතිවාසිකම් සීමා කිරීම ඉලක්ක කර ගනිමින් නීතිමය හෝ වෙන යම් ආකාරවලින් දරන පරිශ්‍රමයන්ට විකල්පයක් ලෙස.
- බහුවිධ මත හා අදහස් වලට ගරු කරමින් අදහස් ආශ්‍රිත ප්‍රබල සංවාදයක නිරත වීම දිරි ගන්වමින් සමාජ මාධ්‍යය වේදිකා තුළ හිතකර සංවාද අවකාශයක් ප්‍රවර්ධනය කිරීමට හා තහවුරු කිරීමට උනන්දුවක් දක්වන පාර්ශ්වකරුවන්ට සහාය දක්වන වේදිකාවක් ලෙස.
- මානව හිමිකම් මත පදනම් වූ, ආචාරධර්මීය හා වගකීම් සහගත සමාජ මාධ්‍යය භාවිතය පිළිබඳ දැනුවත්කම ඇති කරන මෙවලමක් ලෙස.

# මග පෙන්වීම් මාලාව

අප කොටස්කරුවන් වන හෝ අන්තර් ක්‍රියාකාරකම්වල යෙදෙන සියලු සමාජ මාධ්‍යය වේදිකා හා ක්ෂේත්‍ර තුළ දී, හැකි උපරිමයෙන් හා සෑම අවස්ථාවකදීම මෙහි සඳහන් කරුණු උත්පාදනය කිරීම හා පැතිරවීම අවම කිරීමට/පූර්ණ ලෙස නවතා දැමීමට එකඟ වන්නෙමු:

- ජාතිය, ආගම, කුලය හෝ වෙනත් සාධක පදනම් කොටගෙන වෙනස් කොට සැලකීම.
- ස්ත්‍රී, පුරුෂ, සංක්‍රාන්ති සමාජ භාවය පදනම් කර ගත් ප්‍රචණ්ඩත්වය සහ (ස්ත්‍රියක හෝ සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයකු වීම නිසා වෙනස්කම් කිරීම, ලිංගික හිංසනය, ස්ත්‍රීන්ට එරෙහිව ද්වේෂ සහගතව සහ පලිගැනීම සඳහා ඡායාරූප හා වීඩියෝ රූපාවලි යොදා ගැනීම ඇතුලු) කාන්තාවන්ට වෙනස් කොට සැලකීමේ වෙනත් ස්වරූප.
- ලිංගික අපයෝජනය.
- ලිංගික දිශානතිය හෝ ලිංගික අනන්‍යතාව පදනම් කර ගත් හිංසනය.
- ළමා අයිතිවාසිකම් උල්ලංඝනය කෙරෙන, ළමයින් සූරාකෑම සිදුකෙරෙන, ළමා අපයෝජනය හා නීති විරෝධී ළමා ජාවාරමට සම්බන්ධ සිදුවීම්.
- වෛරය හෝ ප්‍රචණ්ඩත්වය, තර්ජනය, බිය ගැන්වීම, සයිබර් හිංසනය සහ භයංකර කථනය උසි ගන්වන අන්තර්ගතයන්.
- ආන්තික ප්‍රජාවන්ට අඩන්තේට්ටම් කිරීම.
- අනීතික ක්‍රියා.
- දත්ත සොරකම සහ (අවසරයකින් තොරව ඡායාරූප යොදා ගැනීම වැනි) තොරතුරු මූලාශ්‍ර හා මාධ්‍යය ආචාරධර්මීය නොවන ආකාරයෙන් ප්‍රයෝජනයට ගැනීම.
- ව්‍යාජ තොරතුරු, සාවද්‍ය තොරතුරු සහ නොමග යැවීම අරමුණු කර ගත් තොරතුරු.
- වගකීම් විරහිත ලිංගික දර්ශන භාවිතය.

COLOMBO | 2019
social media declaration
#EngageSMinSL

**මෙහි අත්සන් කරන අපි 'මානව හිමිකම් මත පදනම් වූ' වගකීම් සහගත, ආචාර ධර්මීය හා ප්‍රජාතන්ත්‍රවාදී සමාජ මාධ්‍යය භාවිතය වැඩි දියුණු කරනු පිණිස පහත දැක්වෙන කරුණු ප්‍රවර්ධනය කරන්නෙමු.**

- තොරතුරු දැන ගැනීමේ අයිතිය හා අදහස් පළ කිරීමේ නිදහස ආරක්ෂා කිරීම හා සුරක්ෂිත කිරීම.
- ඩිජිටල් අයිතිවාසිකම මානව අයිතිවාසිකමක් ලෙස පිළිගැනීම.
- ආන්තීකරණයට ලක්වූ පුරවැසියන්ට සිය අදහස් පළ කිරීමට ඉඩ සලසා දෙන සමාජ මාධ්‍යය අවකාශ සුරක්ෂිත කිරීම හා ආරක්ෂා කිරීම.
- නිවැරදි කරුණු සහිත තොරතුරු පතුරවා හැරීම වැඩි කිරීම හා ප්‍රවර්ධනය කිරීම.
- මාධ්‍යය සාක්ෂරතාව හා තොරතුරු සාක්ෂරතාව ප්‍රවර්ධනය කිරීම.
- විශේෂයෙන් ම ස්ත්‍රී ද්වේෂය, ස්ත්‍රියක වීම නිසා වෙනස්කම් කිරීම හා කාන්තාවන් ඉලක්ක කර ගත් ප්‍රචණ්ඩය, තර්ජන යන ප්‍රවණතාවන් සැලකිල්ලට ගනිමින්, ආන්තීකරණය වූ සහ අවදානමට ලක්ව සිටින ප්‍රජාවන් උදෙසා සමාජ මාධ්‍යය සුරක්ෂිත හා මිත්‍රශීලී අවකාශයක් බවට පත් කිරීම.
- පෞද්ගලිකත්වය සඳහා ඇති අයිතියට ගරු කිරීම.

## සමාජ මාධ්‍යය වේදිකා සතු වගකීම්

- දේශීය භාෂාවලින් (සිංහල, දෙමළ) පළවන අන්තර්ගතයන් සුපරීක්ෂාවට ලක් කිරීම සඳහා භාෂා ධාරිතාව වැඩි කිරීම.

- ශ්‍රී ලාංකික අන්තර්ගතය සම්බන්ධයෙන් වන පරිශීලක පැමිණිලි පිළිබඳ කටයුතු කිරීම සඳහා පත්කෙරෙන සුපරීක්ෂකයන් (moderators) සංඛ්‍යාව, ඔවුන්ගේ ලිංගිකත්වය, භාෂා හැකියාව සහ ඔවුන් සිටින කාල කලාපය සම්බන්ධයෙන් විනිවිද භාවය පවත්වා ගැනීම.

- ශ්‍රී ලාංකික අන්තර්ගතය සම්බන්ධයෙන් පරිශීලකයන් විසින් ඉදිරිපත් කෙරෙන පැමිණලි කිසියම් නිශ්චිත කාල සීමාවක් තුළ දී විමර්ශනය කර විසඳුම් සැපයීමට සහ උග්‍ර ප්‍රචණ්ඩත්වයක් පවත්නා අවස්ථාවල එම කාල සීමාව තවදුරටත් අවම කිරීමට පැහැදිලි ලෙස කැප වීම.

- වෛරය හා ප්‍රචණ්ඩත්වය උසි ගන්වන අන්තර්ගතය සහ සාවද්‍ය තොරතුරු ඉවත් කිරීම සඳහා සමාජ මාධ්‍යය වේදිකාවන් විසින් යොදා ගැනෙන පරීක්ෂණ ප්‍රසිද්ධ කිරීම.

- ක්‍රියාවට නැංවෙන සියලු විසඳුම් තිරසාර, ප්‍රමාණාත්මක සහ ප්‍රතිචාර දක්වන සුලු ඒවා බවත්, අනෙක් කලාපවල දී ද යොදා ගත හැකි බවත් සහතික කිරීම.

- සියලු දේශීය භාෂාවලින්, පහසුවෙන් අවබෝධ කර ගත හැකි ආකාරයෙන් සහ පොදුවේ ලබා ගත හැකි අයුරින් ප්‍රතිපත්ති සම්පාදනය කර පරිශීලකයන්ගේ පෞද්ගලිකත්වය හා සුරක්ෂිතභාවය ආරක්ෂා කිරීමට කැප වීම.

- සමාජ මාධ්‍යයේ දී පරිශීලකයන් විසින් පිළිගත මනා සහ නොපිළිගත මනා දෑ ලිඛිතව පෙන්වා දීම සඳහා විවිධ පාලන තන්ත්‍ර, විද්වතුන් හා උනන්දුවක් දක්වන පාර්ශ්වයන් සමඟ සහයෝගීව තාක්ෂණික සමාගම් විසින් වෘත්තීය මට්ටමින් හා පොදුවේ යොදා ගත හැකි ආචාර ධර්ම පද්ධතියක් සකස් කරනු ලැබීම.

- නිපැයුම් අරමුණට ගැළපෙන බව සහ පරිශීලකයන්ට හෝ සමාජයට අනතුරුදායක නොවන බව සහතික කිරීම සඳහා නව නිපැයුම් පරීක්ෂාවට ලක් කිරීම.

## ආණ්ඩුව සතු වගකීම්

- විශේෂයෙන් අදහස් පළ කිරීමේ නිදහස ඇතලුව මානව අයිතිවාසිකම් තහවුරු කරන හා ආරක්ෂා කරන වාතාවරණයක් නිර්මාණය කිරීම.

- 'සාධාරණ හා සියල්ලන්ට සමාන අවස්ථා ලැබෙන තැනක් ලෙස අන්තර්ජාලය සුරක්ෂිත කිරීම' සඳහා සහ අන්තර්ජාලය මන්දගාමී වීම් හෝ වසා දැමීම් වැළැක්වීම සඳහා 2017 නොවැම්බර් 23 දින නවදිල්ලියේ පවත්වන ලද සයිබර් අවකාශය පිළිබඳ ගෝලීය සමුළුවේ දී අන්තර්ජාලයේ මධ්‍යස්ථතාව ආරක්ෂා කරන බවට ශ්‍රී ලංකා ආණ්ඩුව ලබා දුන් පොරොන්දුවට ගරු කිරීම.

- වෛරය හා ප්‍රචණ්ඩත්වය උසි ගන්වන අන්තර්ගතයට හෝ සාදව්‍ය තොරතුරුවලට, ලිංගිකත්වය මත පදනම් කර ගත් හිංසනයට සහ ඔන්ලයින් ක්ෂේත්‍රයේ දී අසමාන ලෙස සැලකීමට එරෙහිව සටන් වදින විට, පවත්නා දේශීය නීතිමය රාමු සහ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය(ICCPR) වැනි ශ්‍රී ලංකාව අත්සන් තබා ඇති ජාත්‍යන්තර ගිවිසුම් ක්‍රියාත්මක කිරීම.

- ඒ ඒ පරිශීලකයාගේ පෞද්ගලිකත්වය හා දත්ත ආරක්ෂාව සඳහා විශේෂිත, සවිස්තරාත්මක නීති මාලාවක් පැනවීම.

- සියලු නීතිමය ප්‍රතිසංස්කරණ, අදහස් පළ කිරීමේ නිදහස සම්බන්ධ ජාත්‍යන්තර ප්‍රමිතීන් අනුගමනය කරන බව සහතික කිරීම.

- ඔන්ලයින් ක්ෂේත්‍රය තුළ සාවද්‍ය තොරතුරු හා නොමග යැවීම අරමුණු කර ගත් තොරතුරු පතුරවා හැරීම සඳහා යොදා ගන්නා ක්‍රම පිළිබඳව සොයා බැලීම සඳහා කරන පර්යේෂණයන්ට සහාය දීම සහ ඩිජිටල් සාක්ෂරතාව ජාතික අධ්‍යාපන විෂය නිර්දේශයට එක් කිරීම සඳහා කටයුතු කිරීම.

- සමාජ මාධ්‍යය වේදිකා ඇතුලු ඔන්ලයින් ක්ෂේත්‍රය තුළ සිදුවන අනුග්‍රාහක දේශපාලන ප්‍රචාරයන් සම්බන්ධයෙන් ද, භෞතිකව ප්‍රසිද්ධ කෙරෙන අත්පත්‍රිකා, චක්‍රලේඛ හා දැන්වීම්වලට සමාන අන්දමින් කටයුතු කරන බවට සහතික වීම.

- වෛරය හා ප්‍රචණ්ඩත්වය උසි ගන්වන අන්තර්ගතය සහ සාවද්‍ය තොරතුරු පතුරවා හැරීම සම්බන්ධයෙන් වගවීමට සමාජ මාධ්‍යය වේදිකාවලට පවත්නා බැඳීම වැඩි කිරීම සඳහා එක්සත් රාජධානියේ පාර්ලිමේන්තුව ගෙන ඇති පියවර වැනි අවස්ථා සලකා බැලීම.

- රටේ බොහෝ ප්‍රදේශවල අන්තර්ජාල ප්‍රවේශය නොමැති බැවින්, ප්‍රවේශ පහසුකම් නොමිලේ සපයන ව්‍යාපෘතිවලට පහසුකම් සැපයීම මඟින්, අන්තර්ජාලය භාවිතා කිරීමේ අවස්ථා ප්‍රවර්ධනය කොට, විශ්වීය ප්‍රවේශයන් ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කිරීම.
(උදාහරණ - googleloon)

- වෛරී කථනයට එරෙහිව සටන් කිරීම සඳහා වන ප්‍රතිවිරුද්ධ පණිවුඩ ප්‍රචාරණයට සහාය දීම.

## මාධ්‍ය සංවිධාන සහ සිවිල් සමාජය සතු වගකීම්

- අවදානමට ලක්ව සිටින හා ආන්තිකරණය වූ ප්‍රජාවන්ගේ අයිතිවාසිකම් තහවුරු කරන හා ආරක්ෂා කරන, හිතකර, මිත්‍රශීලී වාතාවරණයක් ඩිජිටල් ක්ෂේත්‍ර ඇතුලු ක්ෂේත්‍රයන් තුළ නිර්මාණය කිරීමට ආණ්ඩුව දිරි ගැන්වීම.

- අදාළ රේඛීය අමාත්‍යාංශයන්හි සහාය ඇතිව වර්තමාන නීති පද්ධතිය යටතේ තමන්ට හිමි වන ඩිජිටල් අයිතිවාසිකම් පිළිබඳව පරිශීලකයන්ට අධ්‍යාපනය ලබා දීම පිණිස මාධ්‍යය හා තොරතුරු සාක්ෂරතාව සහ ඩිජිටල් සුරක්ෂිතතාව සම්බන්ධයෙන් මහජනයා දැනුවත් කරන දීර්ඝ කාලීන වැඩසටහන්වලට සහාය දීම සහ එවැනි වැඩසටහන්වල අවශ්‍යතාව පෙන්වා දෙන උපදේශකයන් ලෙස ක්‍රියා කිරීම.

- ඩිජිටල් සාක්ෂරතාව අධ්‍යාපන හා උසස් අධ්‍යාපන විෂය නිර්දේශවලට ඇතුළත් කරන ලෙස ආණ්ඩුවට බලපෑම් කිරීම.

- සමාජ මාධ්‍යයෙහි පළ කෙරෙන ව්‍යාජ තොරතුරු, සාවද්‍ය තොරතුරු සහ නොමග යැවීම අරමුණු කර ගත් තොරතුරු අනාවරණය කිරීම හා නිවැරදි කිරීම.

- වෛරී කථනයට එරෙහිව ප්‍රතිරෝධය පාන සහ සටන් කරන ප්‍රධාන ධාරාවේ නිල මාධ්‍ය වෙබ් අඩවිවලට සහ සමාජ මාධ්‍යය ගිණුම්වලට දක්වන මහජන අදහස් දැක්වීම් මධ්‍යස්ථ කිරීමේ සහ අන්තර්ගතය නඩත්තු කිරීමේ ප්‍රතිපත්ති හඳුන්වා දෙමින් එම ප්‍රතිපත්ති මුද්‍රිත මාධ්‍යයේ ලිපි, තීරු ලිපි හෝ විකාශන මාධ්‍යයන්ගේ අවමන්කාරී හෝ වෛරී අන්තර්ගතය ඉවත් කිරීමට යොදා ගන්නා සංස්කාරක ප්‍රතිපත්තිවලට සමාන කිරීම.

- මියැන්මාරයේ “Flower Speech” ව්‍යාපාරය මෙන් වෛරී කථනයට එරෙහිව සටන් කිරීමට සහ ගෞරවනීය, මානව හිමිකම් මත පදනම් වූ හා ආචාර ධාර්මික ඔන්ලයින් කථනය උදෙසා උද්දේශනයේ යෙදෙන ව්‍යාපාර නිර්මාණය කිරීම සහ නිර්මාණය කිරීමට සහාය වීම.

**පාර්ශවකරුවෝ:**

Centre for Policy Alternatives | Eastern Province Journalist Forum | Groundviews.org | Hashtag Generation | Internet Media Action | Jaffna Press Club | Lanka News Web | Law and Society Trust | Maatram.org | Movement for Land and Agricultural Reform | Nelum Yaya Foundation | Outbound Today | PEaCE ECPAT Sri Lanka | Rights Now Collective for Democracy | Sarvodaya Shramadana Movement | Sri Lanka Muslim Media Forum | Srilanka Working Journalists' Association | Transparency International Sri Lanka | Vikalpa.org

COLOMBO | 2019

social media declaration

#EngageSMinSL

# "Hardwired for Life: Human Rights Online and Offline"

10 YEARS IN 2017

විකල්ප

journalism for citizens

#EngageSMinSL

vikalpa.org | socialmedialanka.org | @vikalpavoices | facebook.com/Vikalpasrilanka | editor@vikalpa.org | sampath@cpalanka.org | +94 11 2081384